**ශීර්ෂය 187 - ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2014 වර්ෂය**

-----------------------------------------------------------------------------------------------------------

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේද යෙහි අමාත්‍යාංශ යේ ගිණුම් පිළිබද පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

**1.1 විගණන විෂය පථය**

--------------------

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 ඔක්තෝබර් 28 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ වගකීම.**

------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 174.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 142.10 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 31.90 ක් හෙවත් සියයට 18.33 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2014 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 125.29 | 99.23 | 26.06 | 20.80 |
| මූලධන | 48.71 | 42.87 | 5.84 | 11.99 |
| **එකතුව** | **174.00** | **142.10** | **31.90** | 18.33 |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **විෂය අංකය** | **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|---|
| | **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 187 | 2.00 | 1.65 | 0.3 | 0.76 | 10 | 2.53 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

------------------------------

අමාත්‍යාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.මිලියන 14.9 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

----------------------

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරික්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3.1 ඡේදයේ සිට 3.10 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

**3. ශීර්ෂය 187- ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය**

----------------------------------------------

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

--------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසි |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ඇ) | ලැබෙන චෙක්පත්,මුදල් ඇණවුම් ආදිය සඳහා වූ ලේඛනය | මුදල් රෙගුලාසි 451 |
| (ඈ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454 (2) |
| (ඉ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| (ඊ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (උ) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |
| (ඌ) | වාහන ලොග් පොත | මුදල් රෙගුලාසි 1645 (අ) |

(එ) වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය — මුදල් රෙගුලාසි 1647(ඉ)

(ඒ) ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය — රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය

## 3.2 විගණන සාක්ෂි නොවීම

වාර්තා කර ඇති පරිදි අමාත්‍යාංශයට අදාල මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නිම නොකළ රු. 4,750 ක් වටිනා ගෙවීම් වවුචරයක් අස්ථාන ගතවී තිබුණි.

## 3.3 විසර්ජන ගිණුම

### අයවැය විචලනය

වැය විෂයයන් 16 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 ක සිට සියයට 99 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

## 3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 3.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 3.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2014 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**3.4.3 අභ්‍යන්තර විගණනය**

-------------------------

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොමැති අතර අභ්‍යන්තර විගණන කටයුතු සිදුකර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**-------------------------------------**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2015 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය 2015 මැයි 31 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**3.6 බේරුම් නොකළ බැරකම්**

**--------------------------**

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.36,820,200ක් වූ අතර, එය වර්ෂයකට වඩා අඩු කාල පරාසයක් විය.

**3.7 අනුකූල නොවීම්**

**-----------------**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

**---------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | **රු.** | |
| **(අ) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ** | | |
| 2010 මැයි 14 දිනැති අංක සීජ/1/17/1 දරන ජනාධිපති කාර්යාලයේ චක්‍රලේඛයේ 3 ඡේදය | - | අමාත්‍යවරුන්ගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය වෙනුවෙන් වෙන්කළ යුතු උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් වුවද, |

අමාත්‍යවරයාට නිල වාහන 5 ක් සහ නියෝජ්‍ය අමාත්‍යවරයාට නිලවාහන 6 ක් පරිහරණය කර තිබුණි.

**(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය**
**------------------------------**

| | | |
|---|---|---|
| 2.14 මාර්ගෝපදේශය | 124,000 | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානවලට පටහැනිව ජංගම දුරකථනයක් මිලදී ගෙන තිබුණි. |

**3.8 මානව සම්පත් කළමනාකරණය**
**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**
**--------------------------------------------------------**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 07 | 05 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 18 | 11 | 07 |
| (iii) | ද්විතියික මට්ටම | 02 | 02 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 14 | 13 | 01 |
| | එකතුව | 41 | 31 | 10 |